**උතුරු අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 2014**

-----------------------------------------

උතුරු අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

----------------------------------------------------------------------------------

වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය එවකට මහා මාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරිය පිළිවෙලින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. කොළඹ සහ යාපනය මෙන්ම රටේ උතුරු කෙළවර සම්බන්ධ කිරීමෙන් අනතුරුව ජාතික අධිවේගී මාර්ග ජාලයේ කොටසක් ලෙස උතුරු අධිවේගී මාර්ගය ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. යෝජිත නුවර අධිවේගී මාර්ගයට සම්බන්ධකයක් සමඟ කොළඹ සිට දඹුල්ල දක්වා දීර්ඝ කරන කිලෝමීටර 191 සඳහා අධිවේගී මාර්ගය ඉදිකිරීමට මෙම ව්‍යාපෘතිය යටතේ පැකේජ 10 ක් ඇතුළත් විය. 2014 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘතියේ මූල්‍ය විධිවිධාන හා කාලය තීරණය කර නොතිබුණි. කෙසේ වෙතත් ශ්‍රී ලංකා රජය විසින් ප්‍රතිපාදිත අරමුදල් වලින් ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල

සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජයේ අරමුදලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වන වත්කම් සහ වගකීම්, හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

වෙනත් ව්‍යාපෘති 03 කින් ස්ථාවර වත්කම් අයිතම 108 ක් ව්‍යාපෘතිය වෙත මාරු කර තිබුණු බව නිරීක්ෂණය විය. මූල්‍ය ප්‍රකාශන අනුව රු. මිලියන 5.29 ක් වටිනා එම වත්කම් වල අගය ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා ඇති රු. මිලියන 3.8 ක වත්කම් වල අගය සමඟ නොගැලපුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

----------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

----------------------

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ සඳහන් පරිදි, 2014 දෙසැම්බර් 31 දින වන විටත් මූල්‍ය විධිවිධාන අවසන් කර නැතත් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර තිබුණි. ශක්‍යතා අධ්‍යයනය, ඉඩම් පවරා ගැනීම් සහ වෙනත් මෙහෙයුම් පිරිවැය ආදී ව්‍යාපෘති ආරම්භක පිරිවැය මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබා දුන් රු. මිලියන 335.95 ක අත්තිකාරම් මුදලින් සිදු කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

-----------------

2013 ජනවාරි මාසයේදී ආරම්භ කළ අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2015 අගෝස්තු මස සිට තාවකාලිකව නවතා දමා තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් සිය කැමැත්තෙන් දෙනු ලබන කොන්ත්‍රාත්තු යටතේ පැකේජ 10 ක් අතුරින් පැකේජ 04 ක් යටතේ උතුරු අධිවේගී මාර්ගයේ වේයන්ගොඩ සිට ගලගෙදර දක්වා ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් 05 ක් තෝරා ගෙන තිබුණු බවත් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම අමාත්‍ය මණ්ඩලය විසින් 2014 නොවැම්බර් 12 වෙනි දින අනුමත කර තිබුණු බවත් නිරීක්ෂණය විය. කෙසේ වෙතත් මාස 08 ක් අවසාන වන විටත් කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත් අවසන් කර තිබුණි.

(ආ) මාර්ග පථය හා මාර්ගයේ කොටස් ආදිය වෙනස් කිරීම් ඇතුළු ව්‍යාපෘතියේ මූලික විෂය පථය වෙනස්කම් කිරීමටත් මධ්‍යම අධිවේගී ව්‍යාපෘතිය ලෙස නැවත නම් කිරීමටත් ව්‍යාපෘතිය කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් එවැනි වෙනස්කම් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ රු. මිලියන 9.86 ක පිරිවැයකට උතුරු අධිවේගී මාර්ගයේ එඬේරමුල්ල සිට කුරුණෑගල දක්වා අදියර තුනක ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට ව්‍යාපෘතිය විසින් ජාත්‍යන්තර සමාගමක් තෝරාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. පසුව අධිවේගී මාර්ගයේ එඬේරමුල්ල සිට ගම්පහ දක්වා කොටස කඩවත සිට ගම්පහ ලෙස වෙනස් කර තිබුණි. එම නිසා එම මාර්ග කොටස සඳහා සිදු කළ ශක්‍යතා අධ්‍යයනය යල්පැනගිය හා නිශ්කාර්ය එකක් බවට පත්ව තිබුණි.

(ඈ) උතුරු අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් 2014 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 20.03 ක් වියදම් කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතිය විසින් අත්පත් කර ගැනීමට ඇති ඉඩම් වල විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.